# ආගමන සමයේ පළමුවන සතිය
# සෙනසුරාදා

| පළමුවන දේව ප්‍රකාශනය | ඉසයියස් 30 :19-21, 23-26 |
|---|---|

යෙසයා දිවැසිවරයාගේ පොතෙන් උපුටා ගත් කොටසකි.

*කරුණාබර වූ ස්වාමින් වහන්සේ ඔබේ හඬ අසන සේක.*

ජෙරුසලමේ සිටින සෙනඟෙනි, ඔබ තවත් අඬන්නේ නැත. සමිඳාණන් වහන්සේ දයාන්විතය. ඔබේ මොරගැසීමට උන් වහන්සේ සවන් දී ඔබට පිළිතුරු දෙන සේක. සමිඳාණන් වහන්සේ විපත නමැති කෑම ද පීඩා නමැති වතුර ද ඔබට දෙන නමුත්, ඔබට උගන්වන පිණිස උන්වහන්සේම ඔබ සමඟ වැඩ සිටින සේක. උන්වහන්සේ සොයා යාමට ඔබට වුවමනාවක් ඇති නොවේ. ඔබ මාර්ගයෙන් දකුණට හෝ වමට හෝ හැරී නොමඟ යන විට, "මෙන්න, හරි මාර්ගය, මෙහි ඇවිදින්නැ" යි කියන හඬක් ඔබට පිටුපසින් ඇසෙනු ඇත.

ඔබ බීජ වැපුරූ කල ඒවා වැඩෙන පිණිස සමිඳාණන් වහන්සේ වර්ෂාව එවන සේක. උන් වහන්සේ ඔබට සාරවත් මහා අස්වැන්නක් දෙන සේක. ඔබේ ගවයන්ට ගොදුරු පිණිස විශාල තණබිම් ඇති වන්නේ ය. බිම් හාන ගවයෝ ද කොටළුවෝ ද ඉතාමත් පෝෂ්‍යදායක ආහාර කන්නෝ ය. ඔබේ සතුරන්ගේ බලකොටු වැටී, සතුරා මරා දමන දවසේ දී, පර්වතය හා කඳු මුදුන්වලින් ජලධාරා ගලා එන්නේය.

සමිඳාණන් වහන්සේ තමන් සෙනඟට පහර දීමෙන් ඇති කළ තුවාල බැඳ සුව කරන දවසේ දී හඳ එළිය ඉර එළිය මෙන්ද, ඉර එළිය සත් ගුණයකින් වැඩි වී සත් දවසක එළිය එක් වූවාක් මෙන් ද බැබළෙන්නේ ය.

*දේව වචනය මෙසේ ය.*

| පිළිතුරු ගීය | ගීතාවලිය 147 : 1 – 6 |
|---|---|

පිළිතුර: සමිඳාණන් වහන්සේ අදහන්නෝ භාග්‍යවන්තෝ ය.

ගීය: සමිඳුන්ට ප්‍රශංසා කරන්න.
අපේ දෙවිඳුන්ට පසස් ගී ගැයීම යහපත්ය.
එතුමන් පැසසීම පියකරු ය, හොබනේ ය.
සමිඳාණෝ ජෙරුසලම ගොඩනගන සේක.
විප්‍රවාසීහු ඉශ්රායෙල් සෙනග රැස් කරන සේක.

එතුමාණෝ බිඳුණු සිත් ඇත්තන් සුව කරන සේක.
ඔවුන්ගේ තුවාළ බඳින සේක.
එතුමාණෝ තාරකාවන් එකින් එක ගණන් කරන සේක.
ඒ සියල්ලට නම් තබන සේක.

අප සමිඳාණෝ උතුම් ය. ඉතා බලසම්පන්න ය.
එතුමන්ගේ ඥානය අසීමිත ය.
සමිඳාණෝ දීනයන් ඔසවන සේක.
දුදනන් පහතට හෙළන සේක.

| සුපුවත් ජය නද |
|---|

ආලේලූයා! ආලේලූයා!
හමුවිය හැකි බැවින් සමිඳුන් සොයා යන්න.
ළඟම සිටින බැවින් එතුමන් අයදින්න.
ආලේලූයා!

| සුවිශේෂය | මතෙව් 9 : 35–10, 1, 6–8 |
|---|---|

සුවිශේෂක මතෙව් තුමන් විසින් ලියන ලද දේව වාක්‍යය නම් මෙසේය.

*ජේසුස් වහන්සේ ජනකාය දැක ඔවුන්ට අනුකම්පා කළ සේක.*

ජේසුස් වහන්සේ ඔවුන්ගේ ධර්ම ශාලාවල උගන්වමින් ද රාජ්‍යය පිළිබඳ සුබ අස්න දේශනා කරමින් ද, හැම අන්දමේ ලෙඩ රෝග සුව කරමින් ද සියලු නුවරවල හා ගම්වල සැරිසැරූ සේක.

ජේසුස් වහන්සේ ජනකාය දැක, ඔවුන් එඬේරෙකු නැති බැටළුවන් මෙන් දුක් ගැහැට විඳිමින් විසිර ගොස් සිටි බැවින් ඔවුන්ට අනුකම්පා කළ සේක. එවිට උන්වහන්සේ සිය ශ්‍රාවකයන්ට කතා කොට, "අස්වැන්න බහුලය. ගොවීහු විරලය. එහෙයින් අස්වැන්න කැපීමට ගොවීන් එවන ලෙස අස්වැන්න භාර හිමියා හට අයදින්නැ" යි වදාළ සේක.

ජේසුස් වහන්සේ සිය ශ්‍රාවකයන් දොළොස් දෙනා තමන් වෙත කැඳවා, අශුද්ධාත්මයන් දුරු කරන පිණිස ද සියලු ආකාර ලෙඩ රෝග සුව කරන පිණිස ද ඔවුන්ට බලය පවරා දුන් සේක.

ඉශ්රායෙල් වංශයේ නැති වූ බැටළුවන් වෙතට යන්න. එසේ ගොස් ස්වර්ග රාජ්‍යය ළංවී ඇතැයි දේශනා කරන්න. රෝගීන් සුව කරන්න. මළවුන් නැගිටුවන්න. ලාදුරු රෝගීන් පවිත්‍ර කරන්න. යකුන් දුරු කරන්න. ඔබ නොමිලයේ ලැබුවහු ය. නොමිලයේ දෙන්න යැ" යි වදාළ සේක.

*සමිඳාණන් වහන්සේගේ සුභාරංචිය මෙසේ ය.*